# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## පළමු වාර පරීක්ෂණය - 2020
## පරිසරය

නම / අංකය : ...................................................... 5 ශ්‍රේණිය කාලය – 1 ¼ යි

**01. පහත ප්‍රශ්න සඳහා නිවාරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

(01.) පස සාරවත් වීමට උපකාරී වන සතෙකි.

I. ගරුඩා II. ගැඩවිලා III. බිංකුණ්ඩා IV. හැකරැල්ලා

(02.) පැතිරී යන වසංගත රෝග පිළිබඳ දැනුම් දීම් සිදු කරන රාජ්‍ය නිලධාරියා වන්නේ,

I. ග්‍රාම සේවක මහාතා
II. පවුල් සෞඛ්‍ය සේවිකාව
III. ප්‍රාදේශීය සෞඛ්‍ය නිලධාරීතුමා
IV. මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා

(03.) සුළං හමන දිශාව දැනගත හැකි වන්නේ,

I.සුළං දිශා දර්ශකයෙන් II. අනිලමානය
III. මිනුම්සරාව IV. වර්ෂාමානය

(04.) ගොක් කොළ ලබා ගන්නේ,

I. පොල් ගසෙනි II. කොස් ගසෙනි
III. තල් ගසෙනි IV. පුවක් ගසෙනි

(05.) සෙක්කුව යොදාගනු ලබන්නේ,

I. වළං සෑදීමට II. ගොයම් මැඩීමට
III. තෙල් සිඳ ගැනීමට IV. ලීයක් සුමට කිරීමට

(06.) කොහොල්ලෑ සහිත දැත් පිරිසිදු කිරීමට යොදා ගනු ලබන්නේ,

I. භූමිතෙල් II. පෙට්‍රල්
III. දෙහි IV. සියඹලා

(07.) අම්බලන්තොටින් මුහුදට වැටෙන ගඟකි,

I. මහවැලි ගඟ II. නිල්වලා ගඟ III. ගිං ගඟ IV. වලවේ ගඟ

(08.) තැඹිලි පාට නටුව සහිත සුදු පැහැති මලකි.

I.ඇන්තූරියම් II. කපුරු III. සේපාලිකා IV. රෝස

(09.) ඇඹුල් සහිත ආහාරයක් දැමීමට හෝ පිසීමට නුසුදුසු භාජනයකි,

I. වීදුරු භාජනය II. මැටි භාජනය

III. ප්ලාස්ටික් භාජනය IV. ඇලුමිනියම් භාජනය

(10.) පැඟිරි තෙල් ශරීරයේ තවරා ගන්නේ,

I. මදුරුවන් ශරීරයේ වැසීමෙන් වැළකීමට

II. මැස්සන් ශරීරයේ දැවටීමෙන් වැළකීමට

III.හම පැහැපත් කර ගැනීමට

V. පලු ඇතිවීම වළක්වා ගැනීමට

(ලකුණු 20)

**02. පහත පළාත්වලට අයත් දිස්ත්‍රික්කය සොයා යා කරන්න.**

| | |
|---|---|
| උතුරු පළාත | කුරුණෑගල |
| දකුණු පළාත | යාපනය |
| බස්නාහිර පළාත | මාතර |
| ඌව පළාත | කළුතර |
| වයඹ පළාත | බණ්ඩාරවෙල |

(ලකුණු 10)

**03. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලාංඡනයේ පහත දැක්වෙන එක් එක් සංකේත වලින් නිරූපණය වන අදහස් ලියන්න.**

(1) සිංහයා

(2) ධර්ම චක්‍රය

(3) ඉර හඳ

(4) පුන් කළස

(5) වී කරල් (ලකුණු 10)

**04. වරහන් තුළින් තෝරා නිවැරදි පිළිතුර ලියන්න.**

(1) ලී කැටයම් සඳහා ________________ ප්‍රසිද්ධියක් උසුලයි.

(2) බ්‍රිතාන්‍ය කොඩිය පහත හෙළා යළි මොහොතකට හෝ අපගේ ජාතික කොඩිය එසවූයේ ______________________ ය.

(3) මින්නේරි දෙවියෝ නමින් හැඳින්වූයේ ________________ රජුය.

(4) පියනකින් නොවසා පිසින ලද ආහාරය වන්නේ _______________ ය.

(5) උදේ ආහාරයට වඩාත් සුදුසු වන්නේ __________________ ය.

(6)________________ වැවකින් ජලය පිටකරන ස්ථානයයි.

(7) ආදිවාසීන් ජීවත්වන ප්‍රදේශයකි ____________________.

(8) කිරි කොරහ නැටුම ____________ විසින් කරන ශාන්ති කර්මයකි.

(9) _______________ , ගොදුරු ලෙස ගන්නේ ගොළුබෙල්ලන් ය.

(10)_______________ කඳුකර ප්‍රදේශවල වැඩිපුර සිදුවන ස්වභාවික ආපදාවකි.

(නාය යාම, වාරියපොල ශ්‍රී සුමංගල හිමි, මඤ්ඤොක්කා, ඇම්බැක්කේ දේවාලය, මහසෙන් රජතුමා, දඹාන, ඇට් කුකුළා, ආදිවාසීන්, සොරොව්ව, කඩල)

(ලකුණු 20)

**05. පහත බීජ කරල් ලෙස හටගන්නේ නම් A ද, ගෙඩි ලෙස හටගන්නේනම් B ද යොදන්න.**

| | |
|---|---|
| (1) බෝංචි | |
| (2) වට්ටක්කා | |
| (3) දඹල | |
| (4) බඩ ඉරිඟු | |
| (5) බණ්ඩක්කා | |
| (6) වී | |
| (7) මෑ | |
| (8) කොස් | |
| (9) දං | |
| (10)කුඩළු | |

(ලකුණු 20)

**06. ශ්‍රී ලංකාවේ ජීවත්වන ප්‍රධාන ජාතීන් හතර පහත දැක්වේ. එම ජාතීන්ට අයත් ආගම නිවැරදිව තෝරා ඉදිරියෙන් ඇති කොටුවේ යොදන්න.**

| | | |
|---|---|---|
| සිංහල | | A. හින්දු ආගම |
| දෙමළ | | B. ක්‍රිස්තියානි ආගම |
| මුස්ලිම් | | C. ඉස්ලාම් ආගම |
| බර්ගර් | | D. බෞද්ධාගම |

(ලකුණු 08)

**07. කෙටි පිළිතුරු සපයන්න**

(1) ශ්‍රී ලංකාවේ ජාතික ගීය රචනා කළේ කවු ද? ________________

(2) ක්‍රීඩා අංශයෙන් අපේ රටට ඔලිම්පික් පදක්කම් ගෙන දුන් ක්‍රීඩකයන් දෙදෙනා නම් කරන්න.

01. ____________________ 02. ____________________

(3) ග්‍රාම නිලධාරීතුමාගෙන් ඉටුවන සේවාවන් 02ක් ලියන්න.

01. ____________________ 02. ____________________

(4) ශාකයක මූල පද්ධතියෙන් ශාකයට ඇති ප්‍රයෝජන 02ක් ලියන්න.

01. ____________________ 02. ____________________

(5) පහත සතුන්ගෙන් බෝවන රෝගය බැගින් ලියන්න.

මදුරුවා ____________________

බල්ලා ____________________

(6)පහත උපකරණ කුමන කර්මාන්තයට අයත් දැයි ලියන්න.

මයිනහම ____________________

කියත ____________________

(ලකුණු 12)

PAST PAPERS WIKI